ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
விளையாட்டு அபிவிருத்தித் திணைக்களம்
DEPARTMENT OF SPORTS DEVELOPMENT
අංක 9, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07 / இல. 9, பிலிப் குணவர்த்தன மாவத்தை, கொழும்பு 07 / No. 9, Philip Gunawardena Mawatha, Colombo 07, Sri Lanka.

මගේ අංකය / எனது இல. / My No. – DSD/NSA/COM - 01/2023
ඔබේ අංකය / உமது இல. / Your No. –
දිනය / திகதி / Date – 2023.03.10

ශ්‍රී ලංකා එල්ලේ සම්මේලනයේ අනුබද්ධ සියලුම ක්‍රීඩා සමාජ ලේකම්වරුන් වෙත

**ශ්‍රී ලංකා එල්ලේ සම්මේලනයේ විධායක කමිටුව සඳහා නිලධාරීන් තෝරා පත් කර ගැනීමේ නිලවරණය පැවැත්වීමට අනුකූලව පවත්වනු ලබන අති විශේෂ මහා සභා රැස්වීම - 2023.03.29**

ශ්‍රී ලංකා එල්ලේ සම්මේලනයේ ලියාපදිංචිය තාවකාලිකව අවලංගු කරමින් 2023 පෙබරවාරි මස 22 වන දින නිකුත් කරන ලද අංක 2320/59 දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව තාවකාලික ක්‍රමයක් වශයෙන් ශ්‍රී ලංකා එල්ලේ සම්මේලනයේ පරිපාලනය සහ වෙනත් යම් අවැසි කටයුතු සහ අදාල නිලවරණයන් කැඳවීමට හා පැවැත්වීමටත් එකෙක් යථායෝග්‍ය අයුරින් ඉටු කිරීම උදෙසා 2023.02.21 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් වන මා පත් කරන ලදි.

02. ඒ අනුව ශ්‍රී ලංකා එල්ලේ සම්මේලනයේ විධායක කමිටුව සඳහා නිලධාරීන් තෝරා පත් ගැනීමේ නිලවරණය කැඳවීම හා පැවැත්වීම සිදු කිරීම සඳහා නිලවරණ කමිටුව පත් කිරීමට පවත්වනු ලබන අති විශේෂ මහා සභා රැස්වීම 2023.03.29 දින පෙ.ව. 10.00ට ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශයේ අංක 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07 පිහිටි 04 වන මහලේ ඩන්කන් වයිට් ශ්‍රවනාගාරයේදී පැවැත්වේ.

03. මෙම රැස්වීම පැවැත්වීම හා නිලවරණ කමිටුව පත් කිරීම 1973 අංක 25 දරණ ක්‍රීඩා පනත හා කලින් කලට වෙනස් වන සංශෝධිත ගැසට් නිවේදන අනුව සිදු කෙරේ.

04. මෙම අතිවිශේෂ මහා සභා රැස්වීමට සහභාගිවන ක්‍රීඩා සමාජ නියෝජිතයාගේ තොරතුරු (ඇමුණුම 01) සහ පහත ඉල්ලා ඇති තොරතුරු එදිනට රැගෙන ඒම අනිවාරයෙන් සිදු කළ යුතුය.

1. සම්මේලනයට අනුබද්ධ ක්‍රීඩා සමාජයේ ව්‍යවස්ථාව
2. පසුගිය වර්ෂවල ජාතික සම්මේලනයට මුදල් ගෙවූ රිසිට්පත්
3. ජාතික/ජාත්‍යන්තර තරඟවලට සහභාගි වීමේ විස්තර (දේශීය හා විදේශීය)
4. සම්මේලනයට අනුබද්ධ ක්‍රීඩා සමාජයේ විධායක කමිටු නිලධාරීන්ගේ විස්තර (නම, තනතුර, ලිපිනය, දු.අංකය) හා විධායක කමිටුවේ නිල කාලය, පත් වූ වර්ෂය.
5. විශේෂ මහා සභා රැස්වීම් වාර්තා, මහා සභා රැස්වීම් වාර්තා, අත්සන් ලේඛන සහිතව

මෙම සියළු තොරතුරු අනුව සම්මේලනයට අනුබද්ධ ක්‍රීඩා සමාජයේ හා දිස්ත්‍රික් සංගමයේ සභාපති/ලේකම් සහතික කොට දෙදෙනාගේ නිල මුද්‍රාව යොදා ඉදිරිපත් කළ යුතුය. (එදිනට ඉහත ලිපි ලේඛන නොවරදවාම රැගෙන ආ යුතුය)

05. ඉහත සඳහන් විශේෂ මහා සභා රැස්වීම සඳහා නොවරදවාම සහභාගී වීම සහ ඉල්ලා ඇති තොරතුරු නිසි පරිදී ලබා දී ශ්‍රී ලංකා එල්ලේ සම්මේලනයේ නිලවරණය සාධාරණව සහ අපක්ෂපාතී අයුරින් පැවැත්වීමට සහයෝගය ලබා දෙන මෙන් කාරුණිකව දන්වමි.

අමල් එදිරිසූරිය
අධ්‍යක්ෂ ජනරාල්

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General – Tel. 2697936, Fax 2695822
අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிரு.) / Director (Admin.) – Tel. 2677960, Fax 2693229
අධ්‍යක්ෂ (ක්‍රීඩා) / பணிப்பாளர் (விளை.) / Director (Sports) – Tel. 2694213, Fax 2669883
ප්‍රධාන ගණකාධිකාරී / பிரதம கணக்காளர் / Chief Accountant – Tel. 2697001, Fax 2669881
කාර්යාලය (පොදු) / அலுவலகம் (பொது) / Office (General) – Tel. 2697934, Fax 2695822
E-mail : departmentofsportsdevelopment@gmail.com
Website : sportsdev.gov.lk

**ශ්‍රී ලංකා එල්ලේ සම්මේලනයේ විධායක සභාවේ නිළධාරී මණ්ඩලය තෝරා ගැනීමේ නිලවරණය පැවැත්වීමට අනුකූලව පවත්වනු ලබන අතිවිශේෂ මහා සභා රැස්වීම - 2023.03.29**

**අතිවිශේෂ මහා සභා රැස්වීම නියෝජනය කිරීමට බලය පැවරීමේ ලිපිය**

සංගමයට අනුබද්ධ ආයතනයේ සභාපතිගේ ලේකම්ගේ ප්‍රකාශය;

මෙම අනුබද්ධ ක්‍රීඩා සමාජය නියෝජනය කිරීමට පහත සඳහන් අය වෙත බලය පැවරීමට ............... දින පැවැති විධායක සභාවේ දී තීරණය කරන ලදි.

| | නියෝජිතයාගේ නම | ජා.හැ. අංකය/ රියදුරු බ:/ ගුවන් ගමන් බ: අංකය | දුරකථන අංකය | ලිපිනය |
|---|---|---|---|---|
| 01 | | | | |

සභාපති/ ලේකම් නම :- ..........................................................................................................

සභාපති/ ලේකම්ගේ අත්සන :- ..........................................................................................................

අනුබද්ධ සංගමයේ/ සමාජයේ/ මුද්‍රාව :- දිනය :- ..................................

අනුබද්ධ ක්‍රීඩා සංගමයේ/ සමාජයේ/ නම :- ..........................................................................................

අනුබද්ධ ක්‍රීඩා සංගමයේ/ සමාජයේ/ ලිපිනය :- ..........................................................................................

- ලේකම් හෝ සභාපතිවරයා නියෝජිතයෙකු ලෙස පැමිණෙන්නේ නම් ඔහුගේ/ඇයගේ නම ද නියෝජිතයෙකු වශයෙන් ඉහතින් සඳහන් කළ යුතුය.

(2023.03.29 වන දින පැවැත්වෙන අතිවිශේෂ මහා සභා රැස්වීම සඳහා පැමිණෙන විට තමන්ගේ අනන්‍යතාවය තහවුරු කරගැනීම සඳහා ඇමුණුම අංක 01 සඳහන් මෙම පෝරමය අනිවාර්යයෙන්ම රැගෙන ආ යුතු බව කාරුණිකව සලකන්න.)

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා :-**

1. ලිපිය ලද දිනය - .........................
2. ලියාපදිංචි අංකය - .........................

| | භාර දිය යුතු ලිපි ලේඛන | භාර දී ඇත (V) / නැත (×) |
|---|---|---|
| 1. | අනුසංගමයේ/ සම්මේලනයේ/ ක්‍රීඩා සමාජයේ ව්‍යවස්ථාව | |
| 2. | පසුගිය වර්ෂවල ජාතික සංගමයට මුදල් ගෙවා ලබා ගත් රිසිට්පත් | |
| 3. | දේශීය සහ විදේශීය ක්‍රීඩා තරහ සංවිධානය සහ සහභාගීත්වය | |
| 4. | අනු සංගමයේ විධායක කමිටු නිළධාරීන්ගේ විස්තර (නම,තනතුර, ලිපිනය, දු:අංකය) විධායක කමිටුවේ නිල කාලය, පත් වූ වර්ෂය | |
| 5. | විශේෂ මහා සභා රැස්වීම් වාර්තා, මහා සභා රැස්වීම් වාර්තා, අත්සන් ලේඛන සහිතව | |
| 6. | අවසන් වරට ඉදිරිපත් කරන ලද ගිණුම් වාර්තා (සහතිකය සමඟ), | |